# පොළොන්නරු පොත්ගුල් විහාර අභිලේඛනය නැවත කියවීම

නිමේෂ තිවංකර සෙනෙවිපාල

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
nthiwankara@yahoo.com

පැරණි පොළොන්නරුව නගරයේ දකුණුදිග අන්තයේ පරාක්‍රම සමුද්‍රයට යාබදව සුවිශේෂී පුරුෂ ප්‍රතිමාවක් සහ දුලබ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ප්‍රකට කරවන ආකෘතියකින් යුත් ගොඩනැගිල්ලක් 1906 දී එච්. සී. පී. බෙල් මහතා විසින් හඳුනාගෙන තිබේ. පොත්ගුල් විහාරය ලෙස හඳුන්වන එම ඉදිකිරීමට අයත් ඩී. එම්. ඉසෙඩ්. වික්‍රමසිංහ මහතා විසින් කියවන ලද අභිලේඛනය කියවා ඇත්තේ හුදෙකලා කෝණයකින් බවත්, එහි අන්තර්ගතය සමකාලීන වෙනත් අභිලේඛන සමග සසැඳී නොයන බවත් පෙනෙන්නට තිබේ. එහෙයින් මෙම ලිපිය නැවත කියවා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ ය.

එකී අභිලේඛනය වියතුන් විසින් කියවා ඇති ආකාරයෙහි සාවද්‍ය බවක් පෙනෙන්නට තිබේ. මන්ද යත්, මහා පරාක්‍රමබාහු රජු කෙරෙහි චන්ද්‍රාවතී නම් බිසවක සිටි බවක් කිසිදු මූලාශ්‍රයකින් හෙළි නොවන හෙයිනි. සමහරක් උගතුන් විශ්වාස කරන්නේ, චන්ද්‍රාවතී නමින් මෙම ලිපියෙහි කියැවෙන්නේ පරාක්‍රමබාහුගේ බිසවකැ'යි මහාවංශයේ දැක්වෙන රූපාවතී නම් බිසව යි. එහෙත් හැටදාගේ පුවරු ලිපියේ නිශ්ශංකමල්ල රජුගේ බිසවක වූ චන්ද්‍රා නම් දේවියක පිළිබඳව සඳහන් වෙයි. අසාධාරණ ලෙස රූපාවතී සමග ගලපා ඇති චන්ද්‍රාවතී දේවිය වූ කලි සැබෑ ලෙස ම පරාක්‍රමබාහුගේ බිසවක් නොව, හැටදාගේ ලිපියේ දැක්වෙන නිශ්ශංකමල්ලගේ දෙවැනි බිසව වූ චන්ද්‍රාවතී ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. එකී අභිලේඛනය නිවැරදිව අවබෝධ කරගැනීමට නම් එහි අන්තර්ගත තොරතුරු හා නාමයන් වෙනත් අභිලේඛනවල එන දත්ත සමග සැසඳිය යුතුව පවතියි. ඒ අනුව ප්‍රධාන කරුණු කිහිපයක් පිළිබඳව මෙම පර්යේෂණයේ දී විශේෂයෙන් විමසිය වේ.

මෙහි දී එළඹෙන්නට හැකි නිගමනයන් වනුයේ නිශ්ශංකමල්ල රජුගේ සැබෑ නාමය 'පරාක්‍රමබාහු' බව ය. 'නිශ්ශංකමල්ල' යනු ඔහු කෙරෙහි භාවිත වූ විරුදාවලියක් බව, නිශ්ශංකමල්ලගේ බිසෝවරුන් අතුරින් කාලිංග සුභද්‍රා මහදේවිය අභිබවා කල්‍යාණ මහදේවියගේ බලය ඉස්මතු වීමේ දී තුන්වැනි බිසව වශයෙන් සිටි චන්ද්‍රා බිසව දෙවැනි බිසව බවට පත් වූ බව, නිශ්ශංකමල්ල විසින් සැබෑ ලෙස ම ශාසන ශෝධනයක් හෝ ප්‍රතිසංස්කරණයක් සිදු කරන ලද බව, පොත්ගුල් විහාර ලිපියේ සඳහන් වන, එම විහාරය සඳහා මණ්ඩපයක් කරවූ චන්ද්‍රා දේවිය වූ කලි හැටදාගේ ලිපියේ සඳහන් වන නිශ්ශංකමල්ලගේ තුන්වැනි බිසව බව, එම විහාරය ප්‍රතිසංස්කරණය කරන ලදැයි කියන අග බිසව වූ කලි නිශ්ශංකමල්ලගේ අග බිසව වූ කල්‍යාණ මහදේවිය වන බව සහ පොත්ගුල් වෙහෙර ලෙස හැඳින්වෙන මෙම විහාරය නිශ්ශංකමල්ල රජු විසින් කරවන ලද බව ය. ඉහත අධ්‍යයනයට අනුව වික්‍රමසිංහ මහතා විසින් පොත්ගුල් වෙහෙර ලිපිය අර්ථ දැක්වූ ආකාරය ප්‍රතික්ෂේප කොට එය වෙනත් ආකාරයකින් අර්ථනිරූපණය කළ හැකි බව හඳුනාගනු ලැබිණි.

ප්‍රමුඛ පද : පොත්ගුල් විහාරය අභිලේඛනය, චන්ද්‍රාවතී දේවිය, නිශ්ශංකමල්ල, පරාක්‍රමබාහු